**වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය - 2015**

-------------------------------------------------

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 47(2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 47(2) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

## 2.1 මතය

-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ

ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 2.2.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---

විශ්වවිද්‍යාලයේ සේවයෙන් ඉවත්ව ගිය නිලධාරීන් දෙදෙනෙකු වෙත 2005 හා 2012 වර්ෂවල ලබාදී තිබූ එකතුව රු.10,400ක් වූ උත්සව හා විශේෂ අත්තිකාරම් ණය ශේෂ සමාලෝචිත වර්ෂය වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

---

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.3,054,300ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.25,155ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.3,079,455ක පිරිහීමක් ඇති වී තිබුණි. පුනරාවර්තන ප්‍රදාන රු.26,385,000 කින් වැඩි වුවද, සේවක පාරිශ්‍රමික හා සේවා වියදම් පිළිවෙලින් රු.24,323,375 කින් හා රු. 8,213,098 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 04ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 සහ 2012 වර්ෂයන්හි ඌනතාවය 2013 වර්ෂයේදී සැළකිය යුතු අතිරික්තයක් බවට පත්වී නැවත 2014 වර්ෂයේදී අතිරික්තය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවී සමාලෝචිත වර්ෂයේදී ඌනතාවයක් බවට පත් වී තිබුණි. නමුත් සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා දායකත්වය අඛණ්ඩව වර්ධනය වී තිබුණු අතර 2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී එය සියයට 14කින් වැඩිවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

## 4.1 කාර්යසාධනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඩිප්ලෝමා සුදුසුකම් ලබාගත් අය වෙත උසස් අධ්‍යාපන අවස්ථාවන් ලබාදීම වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ මූලික අරමුණ වී තිබුණි. ඒ අනුව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 හෝ 6 මට්ටම් සමත් වූවන්ට හා මධ්‍යම මට්ටමේ කාර්මික ශිල්පීන් බිහිකරන ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) නොවන පාඨමාලා හැදෑරූ ඩිප්ලෝමාධාරීන්ට උපාධි සුදුසුකම් ලබාගැනීමට අවස්ථාව සලසා දීම විශ්වවිද්‍යාලයේ අරමුණ වේ.

(i) විශ්වවිද්‍යාල පනත අනුව බඳවා ගන්නා සිසුන් වෙත නිදහස් වෘත්තීය අධ්‍යාපනයකට හිමිකම් පැවතියද විශ්වවිද්‍යාලය විසින් අර්ධ කාලීන (සති අන්ත) උපාධි පාඨමාලා ගාස්තු අයකරමින් පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය. මේ අනුව අර්ධ කාලීන පාඨමාලා සඳහා 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා බඳවා ගන්නා ලද ශිෂ්‍යයන්ගෙන් එක් සමාසිකයක් සඳහා රු.10,000 බැගින් වර්ෂ තුනක් පැවැත්වෙන උපාධි පාඨමාලාවක් සඳහා රු.60,000ක පාඨමාලා ගාස්තුවක් අයකර තිබුණි. ඒ අනුව වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පීඨයන් දෙකෙහි පවත්වන ලද උපාධි

පාඨමාලා 19ක් අතුරින් සමාලෝචිත වර්ෂය තුළ මුදල් අය කරමින් අර්ධ කාලීන පාඨමාලා 13ක් පවත්වා තිබුණද පූර්ණ කාලීන පාඨමාලා පවත්වා තිබුණේ 6ක් පමණක් වීමෙන් පූර්ණ කාලීන පාඨමාලා විශ්වවිද්‍යාලයේ උපරිම ධාරිතාවයෙන් පවත්වා නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ii) විශ්වවිද්‍යාලයේ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 41 දෙනෙකු සිටියදී අධ්‍යයන කාර්ය මණ්ඩලය මෙන් තුන් ගුණයක් පමණ එනම්, බාහිර කථිකාචාර්යවරුන් 139 දෙනෙකු වෙත අධ්‍යයන පැය 8291 ක් හා ප්‍රායෝගික පුහුණුවීම් පැය 1236 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළ දී පත්වීම් ලබාදී තිබූ අතර 123 දෙනෙකු වෙනුවෙන් රු.10,392,212 ක් ගෙවා තිබුණි. බාහිර කථිකාචාර්යවරුන් විශාල ප්‍රමාණයක් බඳවාගැනීමට හේතු විගණනයට පැහැදිලි නොකෙරුණු අතර අධ්‍යයන කාර්ය මණ්ඩලය ඉටු කරන ලද අධ්‍යයන පැය ප්‍රමාණය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඔවුන්ගේ කාර්යසාධනය පිළිබඳව පරීක්ෂා කළ නොහැකිවිය.

(iii) වර්ෂය තුළ විශ්වවිද්‍යාලයට බඳවාගත් සිසුන් පිළිබඳව විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව පූර්ණ කාලීන පාඨමාලා සඳහා සිසුන් 134 දෙනෙකු හා අර්ධ කාලීන පාඨමාලා සඳහා සිසුන් 416 දෙනෙකු බඳවාගෙන තිබුණි. මේ අනුව පූර්ණ කාලීන පාඨමාලා සඳහා සිසුන් බඳවාගැනීමේ ප්‍රගතිය අවම මට්ටමක පැවති අතර ඊට හේතු හඳුනාගෙන පිළියම් යෙදීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ආ) 2012-2015 අධ්‍යයන වර්ෂයේ උපාධි පාඨමාලාවන්ට බඳවා ගත් සිසුන් හා පාඨමාලාව අවසන් කර උපාධිය ලබා ගත් සිසුන් පිළිබඳව කරන ලද පරීක්ෂාවේදී පාඨමාලා 08 කින් මෙකාට්‍රොනික්, බහු මාධ්‍ය හා වෙබ් සහ අධ්‍යාපන යන පාඨමාලා 03 සඳහා බඳවා ගත් සිසුන්ගේ උපාධිය සම්පූර්ණ කර තිබුණේ සියයට 65කට වඩා අඩු ප්‍රතිශතයක් බව නිරීක්ෂණය විය. තවද මෙකාට්‍රොනික්, බහු මාධ්‍ය හා වෙබ් යන පාඨමාලා හැරයාමේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 31ක් හා සියයට 19ක් විය. මේ අනුව කළමනාකරණය විසින් සිසුන් පාඨමාලා හැරයාමට හා පාඨමාලා නියමිත පරිදි සම්පූර්ණ නොකිරීමට හේතු වූ කරුණු සොයාබලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය වෙත ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් ක්‍රියාකාරකම් 11ක් ක්‍රියාත්මක කිරීම සඳහා නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන (SSDP) යටතේ රු. මිලියන 100.5ක් වෙන්කර තිබුණි. ඒ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රතිපාදිත රු.මිලියන 3.05 කින් වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ අධ්‍යයන තත්ත්ව සහතික අංශයක් පිහිටුවීම හා තත්ත්ව සහතික වැඩි දියුණු කිරීම සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ පිළිගැනීම ලබා ගැනීම යන කාර්යයන් වර්ෂය තුළ ඉටුකර නොතිබුණි.

(ii) වෘත්තීය තාක්ෂණ කර්මාන්තයේ අවශ්‍යතාවය අනුව පවතින විෂයමාලා 20 ක් සංශෝධනය කිරීමට හා නව විෂයමාලා 10 ක් සංවර්ධනය කිරීමට රු.මිලියන 5 ක් වෙන්කර තිබුණු අතර පවත්නා විෂයමාලා 10 ක් සංශෝධනය කර නොතිබුණු අතර වෙන්කළ මුදලින් සියයට 50 ක් ඉතිරිවී තිබුණි. තවද වෘත්තීය තාක්ෂණ අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ පුහුණුවන්නන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටම් ලබාදීම සඳහා රු.මිලියන 8 ක් වෙන්කර තිබුණද උපයෝජනය කර තිබුණේ රු. මිලියන 4.7 න් එනම් සියයට 59 ක් පමණි.

(iii) පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල විද්‍යායතනවල කාර්ය මණ්ඩලයද ඇතුලත්ව වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ

නිලධාරීන් 10 දෙනෙකු වෙනුවෙන් රු.මිලියන 14.5 ක මුදලක් වෙන්කර තිබුණි. කෙසේ වුවද, වෙන්කළ මුදලින් නිලධාරීන් 04 දෙනෙකු සඳහා පමණක් උපාධි සුදුසුකම් ලබාදීම සඳහා රු. මිලියන 11.03ක් වැය කර තිබුණි.

(iv) ක්‍රියාකාරී සැලැස්මට අනුව මෙම ජාතික වෘත්තීය සුදුසුකම් ඇගයීම්කරුවන් පුහුණු කිරීම සඳහා රු.මිලියන 1.5ක මුදලක් වෙන් කර තිබුණු අතර වෘත්තීය තාක්ෂණ ක්ෂේත්‍රයේ 50 දෙනෙකුද, ක්ෂේත්‍රයට අදාළ ආයතන හා පාසැල් වලින් 200 බැගින්ද මුළු සංඛ්‍යාව 450ක් ලෙස පුහුණු කළ යුතු වුවත් රු.මිලියන 1.13ක් වියදම් කර පුහුණු කර තිබුණේ 219 දෙනෙකු පමණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 ඔක්තෝබර් 24 දිනැති අංක 2013/2014 (ii) දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ විදේශ පුහුණු වැඩසටහන් පිළිබඳ චක්‍රලේඛය ප්‍රකාරව, විදේශ පුහුණු වැඩසටහන් සම්පූර්ණ කළ සියළුම නිලධාරීන් සහභාගී වූ වැඩසටහන පිළිබඳ වාර්තාවක් මාසයක් ඇතුලත ආයතන ප්‍රධානියාට ඉදිරිපත් කළයුතු වුවද විශ්වවිද්‍යාලයේ විදේශ පුහුණු ලබා දී තිබූ නිලධාරීන් වාර්තා ඉදිරිපත් කර නොතිබුණු බව විගණනයේ දී අනාවරණය වූ අතර 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිලධාරීන් 11 දෙනෙකු වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අධ්‍යයන දීමනා සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ ආවරණ අනුමැතිය ලබාදීම ප්‍රතික්ෂේප කර තිබියදී 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා රු.7,144,313ක අධ්‍යයන දීමනා ගෙවා තිබූ අතර ඒවා නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**-------------------------------------------**

ඉදිකිරීමේ පිරිවැය රු.මිලියන 4.7 ක් වූ විශ්වවිද්‍යාලය සතු නිල නිවස 2010 මැයි මාසයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. තවද, 2012 නොවැම්බර් සිට භාවිතයට ගෙන නොතිබුණු අධ්‍යක්ෂ ජනරාල්වරියගේ නිල නිවස සඳහා 2015 සැප්තැම්බර් 08 දින මිලදී ගෙන තිබූ රු. 79,570ක් වටිනාකමැති භාණ්ඩ විගණිත දිනය වූ 2016 මාර්තු 03 දින වනවිටත් නිෂ්කාර්යව පැවතුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බඳවා ගැනීමේ පරිපාටියේ 5.4.2 වගන්තිය ප්‍රකාරව සහකාර ලේඛකාධිකාරී තනතුර සඳහා තෝරා ගැනීමේදී ලිඛිත පරීක්ෂණයේ අවම ලකුණු ප්‍රමාණය ලබානොගත් නිලධාරියෙකු අදාළ තනතුර සඳහා බඳවා ගෙන තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ ස්ථිර කථිකාචාර්යවරුන් 41 දෙනෙකු සිටියදී හා පුරප්පාඩු සඳහා ස්ථිර පදනමින් කථිකාචාර්යවරුන් බඳවා ගැනීමට කටයුතු කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී බාහිර කථිකාචාර්යවරුන් 139 දෙනෙකු සඳහා පත්වීම් ලබාදී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ vii වන පරිච්ඡේදයේ 5.3.2 වගන්තියට අනුව උසස්වීම් ලබන අවස්ථාවේදී නිලධාරිනිය අවසාන වශයෙන් ලැබූ වැටුප,

නව වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපට හෝ වැටුප් පියවරකට අනුරූප වේ නම්, ඇය ආසන්න ඉහල වැටුප් පියවරේ තැබිය යුතු වුවද, සහකාර පුස්තකාලාධිපති තනතුරක් දැරූ නිලධාරිනියක් ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති ii ශ්‍රේණියට උසස්වීම් ලබන විට ඇය ලබමින් සිටි වැටුප නොසලකා නව වැටුප් පරිමාණයේ මූලික වැටුප් පියවරේ පිහිටුවා තිබුණි.

(ඇ) 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව වයස අවුරුදු 60 සම්පූර්ණ වීමෙන් 2009 වර්ෂයේ විශ්‍රාම ගිය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු දෙදෙනෙකු පනතේ 32(2) වගන්තිය අනුව කොන්ත්‍රාත් පදනම මත එම වර්ෂයේ නොවැම්බර් 15 සිට 2014 අගෝස්තු 06 දක්වා විශ්වවිද්‍යාලයේ පීඨාධිපති තනතුරුවල වැඩ බැලීම සඳහා පත්කර, ඔවුන් වෙත විශ්වවිද්‍යාලයට අයත් වාහන 2 ක් වෙන්කර කාලපරිච්ඡේදය තුළ ඉන්ධන දීමනා ගෙවා තිබීම විගණනයේදී මතභේදාත්මක විය. ඒ අනුව 2012 වර්ෂයේ සිට 2014 අගෝස්තු දක්වා උක්ත කථිකාචාර්යවරුන් දෙදෙනා වෙත ඉන්ධන දීමනා ලෙස රු.1,136,218ක් ගෙවා තිබූ අතර 2009 වර්ෂයේ සිට 2011 වර්ෂයට අදාළ ගෙවීම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 අභ්‍යන්තර විගණනය

විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය වෙත විශ්වවිද්‍යාලයේ හා විශ්වවිද්‍යාල විද්‍යායතන 05 ක අභ්‍යන්තර විගණන කාර්යයන් පැවරී තිබුණද, එම කාර්යයන් ඉටු කිරීම සඳහා අභ්‍යන්තර විගණක ඇතුළු ලිපිකරු ශ්‍රේණියේ නිලධාරීන් දෙදෙනෙකු පමණක් අනුයුක්ත කර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකළ පරීක්ෂාවේ දී පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ පැවැත්මට බලපාන්නා වූ නීතිමය රාමුව තුල කාර්යක්ෂම අභ්‍යන්තර පාලන ව්‍යුහයක් ස්ථාපිත කර ගැනීමත් අරමුණුගතව සමස්ථ කාර්යයේම කාර්ය සාධනයක් ඇති කර ගැනීමත් කළමනාකරණයේ ප්‍රධාන වගකීමක් වන අතර ඒ සඳහා සහාය වීමට අවශ්‍ය ක්‍රමවේදයක් සකස් කර එම කාර්යභාරය අභ්‍යන්තර විගණනයට පැවරීම කළ යුතු වුවත්, කළමනාකරණය විසින් ඒ පිළිබඳව අවධානය යොමු නොකර විශ්වවිද්‍යාලයේ ගෙවීම් සම්බන්ධයෙන් පූර්ව විගණනයක් කරවා ගැනීමට අභ්‍යන්තර විගණකයින් යොදවාගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණන සැලැස්මට අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් ආවරණය කිරීමට අපේක්ෂිතව තිබූ ක්ෂේත්‍ර 12 ක් අතුරින්, එක් ක්ෂේත්‍රයක් පමණක් එනම් පුද්ගලයින් පාදක කරගෙන කරන ලද වැටුප් හා බැඳුම්කර ගණනය කිරීම පිළිබඳ විගණනය කර වාර්තා 03 ක් පමණක් නිකුත් කර තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයට අනුබද්ධිත විශ්වවිද්‍යාල විද්‍යායතන 05 ක අභ්‍යන්තර විගණන කාර්යයන්ද මෙම අංශය වෙත පැවරී තිබුණු අතර එම විද්‍යායතන වෙනුවෙන් වෙනම විගණන සැලසුම් සකස් කර නොතිබුණි. කෙසේ වුවද විද්‍යායතන 05 න් 03ක් පමණක් විගණනය කර වාර්තා යවා තිබුණද එම වාර්තා පරීක්ෂාවේදී විද්‍යායතනයන්හි මූල්‍ය හා මෙහෙයුම් ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි විගණනයක් සිදු කර නොතිබුණු බව අනාවරණය විය.

## 5.2 ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය

විශ්වවිද්‍යාලයේ ආයතන කටයුතු සඳහා ආයතන සංග්‍රහයක් සකස් කිරීම සඳහා 2014 මැයි 23 වන දින රු.720,000ක පිරිවැයට කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුමකට එළඹ තිබූ අතර, ගිවිසුම ප්‍රකාරව 2014 නොවැම්බර් 23 දින වන විට අදාල කාර්යය අවසන් කළ යුතු වුවද, විගණිත දිනය වූ 2016 මාර්තු

02 වනවිටත් ආයතන සංග්‍රහය සකස් කිරීමේ කටයුතු නිම කර නොතිබියදී 2015 දෙසැම්බර් 31 දින ඇස්තමේන්තුගත මුළු මුදලම ගෙවා තිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.3 වගන්තිය ප්‍රකාරව අයවැය පිළියෙල කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද සංශෝධිත අයවැය සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 19 වන දින අනුමත කර තිබුණි. ඒ අනුව මූලධන වැය විෂයයන් 13ක් සඳහා වර්ෂය තුළ වෙන් කර තිබූ ප්‍රතිපාදන රු. 100,000 සිට රු.22,250,000 දක්වා මුදලකින් එනම් සියයට 3 සිට සියයට 710 දක්වා වූ පරාසයකින් සංශෝධනය කර තිබීම හේතුවෙන් අයවැය ලේඛනය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | | **නිරීක්ෂණ** |
|---|---|---|
| (අ) අරමුදල් පාලනය | - | කාර්යක්ෂම හා ඵලදායී ලෙස මුදල් භාවිතා නොකිරීම. |
| (ආ) වත්කම් පාලනය | - | විධිමත් ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොගැනීම හා භාණ්ඩ සමීක්ෂණ සිදු නොකිරීම. |
| (ඇ) කොන්ත්‍රාත් පරිපාලනය | - | කොන්ත්‍රාත් සඳහා ගෙවීම් කිරීමේදී නිසි ක්‍රමවේද අනුගමනය නොකිරීම හා කොන්ත්‍රාත් ප්‍රමාදයන් වලක්වා ගැනීමට කටයුතු නොකිරීම |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | - | කාර්ය මණ්ඩල බඳවා ගැනීමේදී බඳවා ගැනීමේ පරිපාටිය අනුව කටයුතු නොකිරීම, උසස් වීම් ලබා දීමේදී නිසි ක්‍රමවේද අනුගමනය නොකිරීම. |
| (ඉ) පාඨමාලා පැවැත්වීම සම්බන්ධව අභ්‍යන්තර පාලනය | - | සම්පත් උපරිම වශයෙන් භාවිතා කළ හැකිවන පරිදි පාඨමාලා සංවිධානය නොකිරීම, දේශකවරුන්ගේ කාර්යසාධනය ඇගයීමට ලක් නොකිරීම. |
| (ඊ) අයවැය ලේඛනමය පාලනය | - | නිසි අධ්‍යයනයකින් පසු ඇස්තමේන්තු සකස් නොකිරීම. |
| (උ) ගබඩා පාලනය | - | නිලධාරීන් වෙත භාණ්ඩ නිකුත් කිරීමේදී නිසි ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම. |